කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 වර්ෂයේ මහනුවර මහ නගර සභාව වෙත පවරා දී තිබූ රු.4,837,105 ක් වූ ජල උපකරණ ගිණුම්වලින් ඉවත් නොකර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අතැති තොගය යටතේ ජංගම වත්කම් තුළ දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් මාස වලට අදාළ රු.103,035,964 ක මුද්දර ගාස්තු හා සැප්තැම්බර් සිට දෙසැම්බර් මාස වලට අදාළ රු.1,723,010 ක උසාවි දඩ ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් සඳහා වැයකළ එකතුව රු.3,513,264 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	- එම -	- එම -

1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 10 ක ශේෂයන්, උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී එකතුව රු.54,287,755 ක වෙනසක් පැවතුණි.	වෙනස්කම් පරීක්ෂාකර නිවැරදි කරන බව.	ගිණුම් ශේෂ උපයෝගී ලේඛන සමඟ සැසදෙන පරිදි නිවැරදි කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,650,608 ක ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ශේෂයට අදාළ ලේඛන, උපලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වැටුප් ප්‍රතිපූර්ණයට අදාලව නිවැරදිව ලේඛන හා උපලේඛන පවත්වාගත යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) පාර්ලිමේන්තු පනත්			
(i) 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනත			
20 වගන්තිය	වරිපනම් වලට අදාළ දේපල තක්සේරු කිරීම වසර 05 කට වරක් සිදු කළ යුතු වුවද, 2016 වර්ෂයේ සිදුකළ තක්සේරු වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු අයකර තිබුණි.	ඉදිරියේදී තක්සේරු කිරීමට කටයුතු කරන බව.	කාලීනව දේපල තක්සේරු කර වරිපනම් අයකළ යුතුය.
(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත			
19 (1) (xiii) වගන්තිය	අමාත්‍යවරයාගේ අවසරයකින් තොරව සභාවේ මන්තාරා සිව් මහල් ගොඩනැගිල්ල හා රජපොළ භූමි ගොඩනැගිල්ල දීර්ඝකාලීනව රු.33,234,556 කට බදු දී තිබුණි.	පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය අනුව බදු දී ඇති බව.	පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

(iii)	2015 පෙබරවාරි 23 දිනැති අංක 1955/7 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත			
	ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව	සභා බල ප්‍රදේශයේ පිහිටි ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානවලින් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.3,387,845 ත්‍රී රෝද රථ නැවතුම් ගාස්තු අයකර ගෙන නොතිබුණි.	අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.
(ආ)	**රීති හා ප්‍රඥප්ති**			
	1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති			
	218 වගන්තිය	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.	සමීක්ෂණ කටයුතු සිදුකරන බව.	සමීක්ෂණය කර වත්කම් වල පැවැත්ම තහවුරු කරගත යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	(i) මු.රෙ. 394	අගරු වූ රු.156,242 ක් වටිනා චෙක්පත් 10 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	තවදුරටත් සොයා බලා කටයුතු සිදුකරන බව.	අගරු චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
	(ii) මු.රෙ. 571 (3)	2019 ට පෙර සිට පැවති කාලය ඉකුත් වූ රු.8,019,281 ක තැන්පත් නිරවුල් කර නොතිබුණි.	ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව.	කාලය ඉකුත් වූ තැන්පත් නිරවුල් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.110,005,496 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.74,705,125 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	58,718,925	60,040,290	69,753,066	47,852,100	42,815,634	33,079,249	16,686,937	57,564,875
(ii)	කුලී	22,240,705	19,433,458	20,635,619	6,282,717	8,781,619	10,039,619	14,279,596	7,484,679
(iii)	බලපත්‍ර ගාස්තු	7,100,000	3,290,736	3,290,736	14,680,625	5,985,000	5,983,999	5,983,999	14,680,625
(iv)	වෙනත් ආදායම්	137,499,000	143,522,256	212,426,624	113,734,039	213,435,979	213,435,979	29,550,426	182,638,407
		225,558,630	226,286,740	306,106,045	182,549,481	271,018,232	262,538,846	66,500,958	262,368,586

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම්		
(i) සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.45,863,254 ක් විය. ඉන් එක ඒකකයක වරිපනම් හිඟය රු.5,000 ඉක්මවූ දේපල 2680 කින් එකතුව රු.29,217,921 ක් ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 ප්‍රකාරව කටයුතු කර අයකර නොතිබුණි.	දේපල තහනම් කිරීමට කටයුතු සූදානම් කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.

(ii)	2022 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ අනුමත කළ ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර 171 ක ඉදිකිරීම් පසු විපරම් කර වරිපනම් බදු අයකර නොතිබුණි.	අදාළ අංශ දැනුවත් කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කරන බව.	දේපල තක්සේරු කර නව තක්සේරුව මත වරිපනම් අයකළ යුතුය.

(ආ) කුලී

(i)	පැරණි සභා භූමියේ පිහිටි නව සිව් මහල් ගොඩනැගිල්ලේ 2018 සිට 2020 කාල පරිච්ඡේදය සඳහා හිඟ බදු කුලී රු.9,000,000 ක් අයකර ගෙන නොතිබුණි.	අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් දැරූ වියදමින් හිඟ කඩ කුලී අඩු කරන ලෙස ඉල්ලා ඇති බැවින් හිඟ මුදල් පවතින බව.	සුදුසු පරිදි හිඟ කුලී අයකර ගත යුතුය.
(ii)	සභාවට අයත් රජපොල භූමි ගොඩනැගිල්ල තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවක් ලබා නොගෙන 2021 වර්ෂයේ බදු දීමට කටයුතු කර තිබුණි.	තක්සේරු වාර්තා නොලැබුණු බව.	තක්සේරු වාර්තා ලබාගෙන බදු දීමට කටයුතු කළ යුතුය.
(iii)	2015 වර්ෂයේ රු.8,315,957 ක් වැයකර ඉදිකර තිබූ රජරුප පොල ගොඩනැගිල්ල 2021 නොවැම්බර් 01 දින සිට කාල සීමාවක් නොදක්වා දීර්ඝකාලීනව බදුගෙන තිබුණු බදුකරුවෙකු විසින් සභාවේ අනුමැතියකින් තොරව අදාළ ගොඩනැගිල්ල කඩා ඉවත්කර එහි වර්ග අඩි 10023 ක දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. සභාව මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ගිවිසුම් ප්‍රකාරව ගොඩනැගිල්ල කඩා ඉවත් කළ හැකි බව.	අනුමැතියකින් තොරව සිදු කළ ඉදි කිරීම් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය		
(i)	කුණ්ඩසාලේ හා පාතදුම්බර ප්‍රාදේශීය සභාව ඒකාබද්ධ වී ගිවිසුම්ගතව 2016 වර්ෂයේ ජපන් ආධාර යටතේ ආරම්භ කරන ලද අලුත්වත්ත පොහොර සැකසුම් කිරීමේ මධ්‍යස්ථානයේ කාබනික පොහොර ක්‍රියාවලිය නිසි පරිදි ඉටුකිරීමට අදාළ එකතු කරන ලද දිරන කසළ,	ප්‍රතිපාදන නොමැති බව.	නිසි ප්‍රමිතියෙන් යුතුව කාබනික පොහොර නිපදවිය හැකි පරිදි අදාල ගොඩනැගිලි හා පරිසරය සකස් කළ යුතුය.

	අඹරන ලද කසළ හා නිපදවන පොහොර වැස්සට නොතෙමී ගබඩා කිරීම, අඹරන ලද කසළ නියමිත ප්‍රමිතියෙන් යුතුව දිරාපත්වීමට අවශ්‍ය පහසුකම් සැලසීම හා පොහොර නිසි ප්‍රමිතියකින් යුතුව ගබඩා කිරීම යනාදී අත්‍යවශ්‍ය කරුණු සඳහා ගොඩනැගිල්ලක් ඉදිකල යුතු වුවත් නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය මත සැලසුම් කළ පරිදි එම ගොඩනැගිල්ල ඉදිකිරීමට නොහැකිවී තිබුණි.		
(ii)	අළුත්වත්ත ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතියේ පොලිතීන් හා ප්ලාස්ටික් මඟින් ඉන්ධනයක් නිපදවීමේ නියමු ව්‍යාපෘතියක් සඳහා 2021 වර්ෂයේ ජනවාරි 28 දින සභාව හා පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගත වී තිබුණද එම පෞද්ගලික සමාගමේ ආරවුලක් හේතුවෙන් ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබූ අතර යන්ත්‍රය සවි කිරීම සඳහා රු.29,782,203 ක් වැය කර සභා භූමිය පස් කපා සකස් කර තිබුණි. තවද, මෙම කොන්ත්‍රාත්කාර ආයතනය ගිවිසුම් කඩ කර වසර 04 ක් ගතවී තිබුණද, ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2024 පෙබරවාරි 13 දින රු.800,925 ක් වැයකර විදුලි කේබලයක් මිලදී ගෙන කසළ අංගන ගොඩනැගිල්ලේ රඳවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන දිනට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි.	ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව.	ආරවුල් විසඳාගෙන ව්‍යාපෘතියේ ඇති අවශ්‍යතා හඳුනාගෙන නිසි ක්‍රමවේදයක් අනුව ශක්‍යතා අධ්‍යයනයකින් පසු විධිමත් ගිවිසුමක් හා අධීක්ෂණයක් යටතේ සැලසුම් කළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය.

3.2 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවට අයත් බැකෝ යන්ත්‍රය අළුත්වත්ත කසළ අංගනය තුළ යොදවා තිබියදී ඉකුත් වර්ෂයේ ගිනි ගැනීමකට ලක්ව අනතුරක් සිදු වී තිබුණි. යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා රු.2,110,099 ක් ගෙවා තිබුණද රක්ෂණ වන්දි ලෙස රු.962,523 ක් ලැබී තිබුණි. සභාවට සිදුවූ රු.1,147,576 ක අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.	මු.රෙ. පරීක්ෂණ සිදුකර ඇති බව.	මු.රෙ. 104(4) පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගත යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.102,570,451 ක් විය. ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.37,031,262 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින ගිණුම් ශේෂ එකතුව රු.14,701,203 ක් විය.	අයකර ගැනීමට කටයුතු කරන බව.	ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.179,742,976 ක වියදම් ණය හිමි හා කර්මාන්ත ණයහිමි ශේෂයකට කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණු අතර එම ශේෂ නිරවුල් කරගෙනද නොතිබුණි.	සොයාබලා ඉදිරියේදී කටයුතු කරන බව.	ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය.
(ඇ)	2016 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා කාලය තුල සභා බල ප්‍රදේශයේ නව සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන ගැසට් පත්‍රයේ පලකර වරිපනම් බදු අය කර නොතිබුණි.	සභාව ස්ථාපිත කළ පසු ඉදිරියේදී අදාළ කටයුතු සිදුකරන බව.	සංවර්ධිත ප්‍රදේශ ගැසට් කර ආදායම් අයකර ගත යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වටිනාකම රු.4,500,000 ක් වූ කැබ් රථයක් 2012 වර්ෂයේ සිට භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.	රේඛීය අමාත්‍යාංශය වෙත විමසීම් කර ඇත.	සුදුසු රාජ්‍ය ආයතනයකට පවරා දීමට හෝ භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2021 වර්ෂයේ රු. මිලියන 46 ක් වැය කර අළුත්වත්ත කසළ අංගන භූමියේ ඉදිකරන ලද මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.	සභාව තේරී පත්වූ පසු සාකච්ඡා කරන බව.	අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව පරිහරණය කරන ඉඩම් කැබලි 20 ක් හා වාහන 02 අයිතිය පවරාගෙන නොතිබුණි.	පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	සභාව සතු වත්කම් නීත්‍යානුකූලව පවරා ගත යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී තනතුරු 06 ක පුරප්පාඩු 08 ක් ද සංවර්ධන නිලධාරි තනතුරේ අතිරික්තතා 19 ක් ද පැවතුණි.	කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවන බව.	පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු අතර අතිරික්තතා සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතුය.
(ආ)	සභාවේ මාර්ග කම්කරුවන්, සෞඛ්‍ය කම්කරුවන් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සෞඛ්‍ය කම්කරුවන් එකතුව 53 දෙනෙකු තම නිත්‍ය රාජකාරීවල යෙදවීමකින් තොරව කාර්යාලගත සේවාවල යොදවා තිබුණි.	කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවන බව.	කාර්ය මණ්ඩලය නිත්‍ය රාජකාරීවල යෙදවිය යුතුය.
(ඇ)	2003 වර්ෂයේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් රු.178,471 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ණය ශේෂ අයකර ගත යුතුය.